# සැවොම එකතුවී කොළඹ මහනගර සභා ප්‍රදේශ දියුණු කිරීමේ අභියෝගයට මුහුණ දෙමු

## කොළඹ මහ නගර සභා සන්ධාන මන්ත්‍රීන් අමතා එහි විපක්ෂ නායක මිලින්ද මොරගොඩ කියයි

සියලු දෙනාම එකතු වී කොළඹ මහ නගර සභා ප්‍රදේශය දියුණු කිරීමේ අභියෝගයට මුහුණ දිය යුතුයැයි කොළඹ මහ නගර සභාවේ විපක්ෂනායක මිලින්ද මොරගොඩ මහතා පැවසීය.

කොළඹ මහ නගර සභාවට තේරීපත්ව සිටින එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරුන් සමග ඊයේ (31) නගර සභා විපක්ෂනායක කාර්යාලයේ දී පැවැති සාකච්ඡාවේ දී මොරගොඩ මහතා මේ බව කීය.

මෙහිදී කොළඹ මහ නගර සභාවේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලෙස මොහොමඩ් හුසේන් මන්සිල් මහතා පත්කර ගැනීමට එකඟ විය.

**මිලින්ද මොරගොඩ මහතා**:- නගරයේ බදු ගෙවන ජනතාවගේ යහපත උදෙසා එකමුතුව කණ්ඩායමක් වශයෙන් සංවිධානාත්මක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි. ජනතාවගේ ඡන්දය ලබාගෙන ජනතා නියෝජිතයින් ලෙස පත්වූ අප ජනතාවට සේවය කළ යුතුයි. අපට තනි ගමනක් නැහැ. සියලු දෙනාම එක්වී නගරය දියුණු කළ යුතුයි.

**මොහොමඩ් හුසේන් මන්සිල් මහතා මෙසේ කීය.**

නගර සභා ඉතිහාසයේ පළමු වතාවට විපක්ෂය වෙනුවෙන් කාර්යාලයක් පවත්වා ගන්නට මෙවර අවස්ථාව ලැබී තිබෙනවා. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රමුඛ රජයේ දැක්ම අනුව නගරය දියුණු කිරීමට අප කටයුතු කරනවා. විශේෂ කොමසාරිස්වරයාගේ පාලන කාලය තුළ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මග පෙන්වීම අනුව කරගෙන ගිය අලංකාර නගරයක් ගොඩනැගීමේ වැඩපිළිවෙළ අගය කළ යුතුයි. එය අඛණ්ඩව පවත්වාගෙන යා යුතුයි. නගරයේ අනවසර ඉදිකිරීම් හා අනවසර වෙළඳ සැල් ඇති කිරීමට දැනටමත් සූදානම් වන අතර එයට ඉඩ දිය යුතු නැහැ.

නාගරික මන්ත්‍රීවරුන් වන මොහමඩ් මහරූෆ්, එම්.එෆ්.එම්. මුසම්මිල්, මධුමාධව අරවින්ද, සමන් අබේගුණරත්න යන මහත්වරු ද මෙහි දී අදහස් දැක්වූහ. කොළඹ නාගරික කොමසාරිස් භද්‍රානි ජයවර්ධන මහත්මිය මෙම අවස්ථාවට පැමිණ මිලින්ද මොරගොඩ මහතා ඇතුළු නගර සභාවේ එක්සත් ජනතා නිදහස් සන්ධාන කණ්ඩායමට සුබ පැතුවාය.



කොළඹ මහ නගර සභාවට පත්වූ එක්සත් ජනතා නිදහස් සන්ධාන මන්ත්‍රීවරුන්ගේ සාකච්ඡාව